# ඊනියා සාම සාකච්ඡා

ඊනියා සාම සාකච්ඡා ආරම්භකිරීම ගැන නැවතත් කතාබහ කෙරෙමින් ඇත. පළමුවෙන් ම කිවයුත්තේ ඊනියා සාම සාකච්ඡා ඇතිවන්නේ අපේ දීනභාවය හේතුකොටගෙන බව ය. මිනීමරණ, ළමුන් බලහත්කාරයෙන් ත්‍රස්තවාදී කණ්ඩායමට බඳවාගන්නා, ඊනියා සටන්විරාම ගිවිසුම දහස්වාරයක් කඩන, බටහිර නියෝජිතයන් ද රැගෙනයන හෙලිකොප්ටරයානවලට ද වෙඩිතබන, විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් යොදවා හමුදාවට පහර දී එමගින් හමුදාව ලවා සිසුන් මරවා ඒ මළ සිරුරුවල ඡායාරූප බටහිර රටවලට යවා එමගින් සිංහලයන් ම්ලේච්ඡයන් ලෙස හඳුන්වාදීමට කැසකවන කොටි සංවිධානය සමග සාකච්ඡා අවශ්‍ය නො වෙයි. කළ යුත්තේ අප සැමදාමත් කී පරිදි හමුදා ක්‍රියා මාර්ගයකින් කොටි පරාජයකිරීම ය. එහෙත් අපට ඊනියා සාම සාකච්ඡාකිරීමට බලකෙරෙයි. ඒ බලකෙරෙන්නේ බටහිරයන් විසිනි. මේ ප්‍රශ්නයේ මුල මැද හා අග සිටින්නේ බටහිරයන් බව තවමත් ඇතැමුන් වටහාගැනීමට මැළිවන්නේ එසේ කළහොත් ඔවුන්ට ලැබෙන නොයෙකුත් තෑගි බෝග, මිල මුදල් හා වටිනාකම් නැතිවන බැවින් ය. මේ සමාජයේ අද වැදගතුන් බවට පත්වී ඇත්තේ බටහිරයන්ගේ මතවාද පිහිටෙන් වැජඹෙන පුද්ගලයන් ය. අද ජනමාධ්‍යයේ තැන ලැබෙන්නේ ද ඔවුන්ට ම ය. උපාලි ආයතනයේ පුවත්පත් කිහිපයක් නොවන්නට ජාතික මතවාදයකට තැනක් නො ලැබෙයි. මෙවිට ඇතැම් කසිකබල් ඊනියා ප්‍රබුද්ධ ජනමාධ්‍යවේදීන් පවසනු ඇත්තේ ජාතික මතවාදලට ඔවුන් ද තැනක් දෙන බව ය. එහෙත් ඔවුන් එසේ ඊනියා තැනක් දෙන්නේ ජාතික මතවාද පටු මතවාද බවට අටුවාවක් ද ලියමින් තම ව්‍යාජ පාණ්ඩිත්‍යය ගැන ස්වයංවින්දනයක් ද ලබමින් ය.

මේ අටුවාචාරීන් දන්නා ජාත්‍යන්තර මතවාදයක් ද නැත. ඔවුන් කී දෙනකු විට්ගන්ස්ටයින්ගේ දාර්ශනික මත හෝ හයිසන්බර්ග්ගේ අනිශ්චය මූලධර්මය හෝ දන්නේදැයි නොදනිමි. කුන්දේරා නවකතා ගැන කියන්නේ මහා අපූරු මතයක් නො වෙයි. ඔහු ප්‍රකාශකරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යටතේ නවකතාව සමාජ විශ්ලේෂණයෙන් වෙන්විය යුතු බව ය. මේ වෙන්වීම නැතහොත් වෙන්කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආත්මය බඳුවෙයි. මේ ඊනියා ප්‍රබුද්ධයෝ අල්තුසාර්ගේ ඊනියා අධිනිශ්චයක් ගැන කතාකරමින් තම නොදැනුම්කම ප්‍රදර්ශනයකරති. අල්තුසාර්ගේ ඕවර්ඩිටර්මින්ඩ් යන්න ඔවුහු අධිනිශ්චය ලෙස වැරදියට පරිවර්තනයකරති. එහි ඇති අධිනිශ්චයක් නැත. අල්තුසාර් කියන්නේ අධිනිර්ණයක් ගැන මිස අධිනිශ්චයක් ගැන නො වෙයි. සමහර බකපණ්ඩිතයන් අධිනිශ්චය යන වැරදි පරිවර්තනය තවදුරටත් "වර්ධනයකර" අධිවිනිශ්චය යන අර්ථයෙන් ද යොදාගනු දැකිය හැකි ය. ජාතික මතවාදීන්ට ලිං මැඩියන් යැයි කියමින් ගරහන මේ පුස්සෝ අල්තුසාර්ගේ අධිනිර්ණය යනු කසිකබල් මාක්ස්වාදයේ පංතිය මත පදනම්ව කෙරෙන විවරණය රැකගැනීමට අටවාගන්නා ලද ටොලම් අපිචක්‍රයක් බව නො දනිති. පනස්හයේ දරුවෝ කෘතිය කියවීමෙන් ගැරඬිහැවක් මෙන් කෙව්ටෙන් බැහැරකළයුතු අධිනිර්ණය ගැන මූලික දැනුමක් ලබාගත හැකි ය. අල්තුසාර්ගේ සංකල්පයෙන් පැහැදිලිවන කරුණ නම් මාක්ස්වාදී පංතිය යන්න බංකොළොත් සංකල්පයක් බව ය. බංකොළොත් සංකල්ප ඔස්සේ ලෝකය බැලීම නම් ප්‍රඥාගෝචර ක්‍රියාවක් නම් නො වෙයි.

පඬියන්ගේ පඬිවදන් කෙසේවෙතත්, ඔවුන්ගෙන් ප්‍රශ්නයක් ඇසිය යුතු ය. මේ ප්‍රශ්නය අප අසන්නේ පළමුවැනි වතාවට නො වෙයි. එහෙත් තවමත් ප්‍රශ්නයට පිළිතුරක් ලැබී නැත. ප්‍රශ්නය අති සරල ය. 1987-90 වකවානුවේ ජනතා විමුක්ති පෙරමුණ සමග සාම සාකච්ඡා පැවැත්විය යුතු යැයි කීවෝ කවරහු ද? අද බටහිර රටවල මුදලින් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන හා එවාහි නියමුවන් එදා කීවේ කුමක් ද? සාමය හා ගැටුම් නිරාකරණය ගැන පඬිවදන් එකල පිටවිණි ද? ප්‍රශ්න කිහිපයක් ලෙස පෙනීගිය ද මේ එකම ප්‍රශ්නයක විවිධ පැතිකඩ බව අවබෝධවිය යුතු ය. එකල ජවිපෙ සමග සාම සාකච්ඡාකිරීමට යෝජනා නොකෙරුනා පමණක් නො වේ. බොහෝ ප්‍රබුද්ධයන්ට අවශ්‍ය වූයේ ජ වි පෙ සුන්නත්දූලි කර දැමීමට ය. ඒ සඳහා ඇතැම්හු විවිධ සංවිධාන ද පිහිටුවාගත්හ. අද සාමය ගැන කතාකරන ඇතැමුන් එදා ප්‍රා වැනි සංවිධාන සමග සම්බන්ධවූයේ සාමකතා පැවැත්වීමට නොව හමුදාවට බැරිනම් තමන්ම මුල්වී ජ වි පෙ සාමාජිකයන් ඝාතනය කිරීමට ය. එදා ප්‍රා සංවිධානයට සම්බන්ධවූවෝ අද එ ජා ප ඇතුළු විවිධ දේශපාලනවල ද සාමාජිකයන් ලෙස සාමය උදෙසා දිවිපිදීමට සැරසී සිටිති! මොවුන්ට ජ වි පෙ කෙරෙහි නොපැවති කරුණාවක්, මෛත්‍රියක්, අනුකම්පාවක් කොටි සංවිධානය කෙරෙහි ඇතිවන්නේ කෙසේ ද? ඒ බටහිරයන්ගේ මුදලේ මෙන් ම මතවාදවල ද අනුහසින් ය. එදා බටහිර රටවල් ක්‍රියාකෙළේ ද අද මෙන් මානවදයාව උතුරායන අන්දමින් නො වේ. ඊනියා සාමසාකච්ඡා සඳහා පහසුකම් සැපයීමට නෝර්වේ රාජ්‍යයවත් වෙනත් බටහිර රාජ්‍යයක්වත් එදා

© Prof. Nalin De Silva

ඉදිරිපත් නො වී ය. සියල්ලන්ට අවශ්‍යවූයේ ජ වි පෙ පරාජයකිරීමට ය. ඒ සඳහා හමුදාව යෙදවීමට ය. අවශ්‍ය පරිදි ඒ කටයුත්තෙහි දී ආධාරදීමට ද ඒ රාජ්‍ය සූදානම් ව සිටියේ ය. මේ වෙනසට හේතුව කුමක් ද? ඊනියා ජාත්‍යන්තර දැනුම දැතින් හා හිසින් ගෙන සිටින ලිං මැඩියන් නොවන සියල්ල දත් ප්‍රබුද්ධ බකපණ්ඩිතයන්ට කරුණාකර ඒ ප්‍රශ්නයට පිළිතුරු දියහැකි ද? එකල ජ වි පෙ විසින් කෙරුණු සියල්ල අපි අනුමත නො කරමු. එහෙත් අපට මේ ප්‍රශ්නවලට පිළිතුරු අවශ්‍ය වෙයි.

අපට නම් ප්‍රශ්නයට පිළිතුර ඇත්තේ මතවාදයෙහි ය. ජ වි පෙ මෙන් නොව කොටි සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදී මාවතක් අනුගමනයකරන්නේ යැයි කිසිවකුට කිවහැකි නො වෙයි. කොටි සංවිධානය අද ඉටුකරමින් සිටින්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය දෙයකි. එදා ජ වි පෙරමුණ ක්‍රියාත්මක වූයේ බටහිරයන්ට අවශ්‍ය දෙයක් සඳහා නො වේ. මතවාදීව ගත්කල කොටි සංවිධානය හා බටහිර රටවල් අතර පරස්පරයක් නොමැත. එහෙත් මතවාදී ව එදා ද ජ වි පෙ හා බටහිරයන් අතර නොපෑහීමක් විය. වැදගත්වන්නේ මතවාදය (ඊනියා දැනුම ද මතවාදයකි. සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතිකවිද්‍යාව ද මතවාද වෙයි. ඩෙරීඩාලාගේ කුන්දේරාලාගේ පඬිවදන් ගැන කියනුම කවරේ ද? මතවාද හා ඊනියා දැනුම අතර වෙනසක් ඇතැයි කියන්නේ ද බටහිරයන් ම නො වේ ද?) මිස අනුගමනයකරන ක්‍රියා පිළිවෙත නො වෙයි. ක්‍රියාව ප්‍රශ්නයක් වනුයේ තමන්ට ඉන් හානියක් වන අවස්ථාවල දී පමණ ය. ඒ සඳහා හොඳම උදාහරණය පසුගිය දා සිදුවූ හෙලිකොප්ටරයට වෙඩිතැබීම ය. ඊනියා සටන්නිරීක්ෂණ කමිටුව (ඉතාමත් පක්ෂග්‍රාහී මේ කමිටුව ආපසු යැවීමට මෙතරම් පමාවන්නේ ඇයි? එයට ද හේතුව බටහිර බලපෑම නො වේ ද?) ද ඒ වෙඩිතැබීම ඊනියා සටන්විරාමය කඩකිරීමක් ලෙස දැක ඇත. එසේ දුටුයේ ඒ හෙලිකොප්ටරයේ බටහිර රටක තානාපති නිලධාරියකු ද ගමන්කළ නිසා ද? යම් අයුරකින් හෙලිකොප්ටරයේ ගමන්කෙළේ සිංහලයන් පමණක් වී නම් නිරීක්ෂකයන් නිරීක්ෂණයකරනු ඇත්තේ කුමක් ද? අපට පෙනෙන්නේ අප බලන ආකාරයට හා අප බලන්නේ අපට පෙනෙන ආකාරයට යැයි “මගේ ලෝකය” කෘතියෙහි අවුරුදු විස්සකට පමණ පෙර ලිවීමට සිදුවූයේ සටන්විරාම නිරීක්ෂකයන් ගැන එකල දැනසිටි නිසා නො වෙයි.

අද කොටි සංවිධානය පාසල් සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන් මිනිස්පළිහක් හා හෙල්ලයක් ලෙස යොදාගැනීමට ක්‍රියාකරයි. එහි දී හමුදාවට ගල්මුල්වලින් පහරදෙන සිසුන් අතින් හමුදාභටයන් මියයෑමට ද ඉඩ ඇත. යම් අයුරකින් තම ජීවිතාරක්ෂාව සඳහා වෙඩිතැබීමට හමුදාවට සිදුවුවහොත්, ඉන් සිසුවකු මියගියහොත් ඇතිවන තත්ත්වය කුමක් ද? මෙරට සිටින පඬියන්, අලෙවියක් නැති එහෙත් ආධාර නිසා පවත්වාගෙන යන සතිඅන්ත පත්තරකඩමාළුවලට ලියන්නන් ආදීන්ගේ මානවදයාව වෙඬරුපිඬක් මෙන් උණු වී පත්තර පිටු දිගේ ගලායනු අපට දැකිය හැකිවනු ඇත. එහෙත් සිසුන් එසේ යොදාගැනීම ගැන විරුද්ධත්වය පෑමට කොටුව දුම්රියපොළ ඉදිරිපිට හෝ ලිප්ටන් වටරවුමේ හෝ පිකට්ටු පැවැත්වීමට ඉදිරිපත්වන්නේ මොන මානවහිතවාදියා ද? යම් අයුරකින් එලෙස සිසුවකු මියගියහොත් බටහිරයන් ද තම මානවහිතවාදී යාතිකාව ගයනු ඇත. එහෙත් ඊශ්‍රායලය එවැනි සිද්ධිවල දී කිසිම අනුකම්පාවක් නැතිව සිසුන්ට වෙඩිතබන විට බටහිරයන්ට ඒ නො පෙනෙයි. කවුරු කළත් වරද වරදක් නො වේ. මෙලොව යමක් වරදක් වන්නේ කරන්නා හා බලන්නා අනුව ය.

යුරෝපා සංගමය කොටි ගමන්බිමන් සඳහා තහනමක් පනවා ඇතැයි කියත් දී තමිල්සෙල්වම් ඊනියා සාම සාකච්ඡා නෝර්වේහි හෝ වෙනත් යුරෝපීය රටක හෝ පැවැත්වීමට යෝජනාකරයි. එහි දී තහනම ගැන විවිධ විග්‍රහකර තහනමක් තිබියදී ද කොටි යුරෝපයේ එහේ මෙහේ යන්නේ කෙසේ දැයි තේරුම්කරදීමට බටහිරයන් ඉදිරිපත්වනු ඇත. ඒ බොරු විග්‍රහවලට වඩා බොරු තහනම ගැන කතාකිරීම අපට වැදගත් ය. බටහිරයන්ගේ මේ බොරු විච්චූරණවලින් අප රැවටිය යුතු නො වේ. ඊනියා සාම සාකච්ඡා සඳහා මහින්ද චින්තනයේ සඳහන් පූර්ව අවශ්‍යතා කොටි සංවිධානයට ඉදිරිපත්කිරීම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ වගකීම වෙයි. ඒ අතර නැගෙනහිර පළාතේ වෙසෙන ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂාකරමින් ඒ පළාතේ පමණක්වත් පළාත්සභා මැතිවරණය පැවැත්වීමට රාජපක්ෂ මහතාට කටයුතු කළහැකි ය. එය ඊනියා සාමසාකච්ඡාවට වඩා ජනතාවගේ විශ්වාසය දිනාගැනීමටත් කොටින්ගේ පරාජයටත් හේතුවනු ඇත. (අප පළාත්සභා අනුමතකරන බවක් මෙයින් ගම්‍ය නො වේ.) ප්‍රභාකරන් පරාදකළ දිනක හෝ උතුරු පළාතේ වැසියන් ආනන්දසංගරී මහතා අනුගමනය කරමින් නිර්භය වූ දිනක හෝ ඒ පළාතේ ද පළාත්සභා මැතිවරණය පැවැත්වීමට හැකිවනු ඇත.

© Prof. Nalin De Silva